Sri Lanka Library Association (SLLA)

# NEWSLETTER

*Quarterly Bulletin of the Sri Lanka Library Association*

Vol 40, Issue I (Jul-Sep-2023)

## Contents

1. Message from the President of the Sri Lanka Library Association (2023/24) 01
2. Council Members – SLLA 2023/2024 01
3. Ex-co Members– SLLA 2023/2024 01
4. Scholarly Enlightenment 02
5. SLLA Education Programme 03
6. Unlocking Synergy: SLLA's Partnership and Alliances 03
7. Information and Public Relations Committee: Events 04
8. Libraries: Workshops, Training programmes & Outreach activities 05
    8.1 Public Libraries: Workshops, Training programmes & Outreach activities 05
    8.2 Academic Libraries: Workshops, Training programmes & Outreach activities 11
    8.3 National Library: Workshops, Training programmes & Outreach activities 15
9. Feature Articles 17
10. Library In Focus: Introduction of a Library 33
11. Building Bridges Through Education 35
12. Publications 39
13. Book Launch 39
14. Forthcoming Events 40

https://www.slla.lk/

ISSN 1391-2531

Vol 40, Issue I (Jul-Sep-2023) ISSN 1391-2531

# හරිත පුස්තකාල සංකල්පය බලාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පුස්තකාල ගොඩනැගිලි භාවිතය



ත්‍රිශාලා වර්ණසූරිය
සහකාර පුස්තකාලයාධිපති,
ප්‍රධාන පුස්තකාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

'හරිත සංකල්පය' වූ කලී 20 වන සියවසේ දී අවධානයට නතු වූ මෑතකාලීනව බොහෝ රටවල ක්‍රියාවට නැංවූ සංකල්පයකි. 15 වන සියවසේ යුරෝපයේ දී ඇති වූ කාර්මික විප්ලවයත් පුනරුදයත් හේතුවෙන් ලෝකයාට උරුම වූ අතුරු ප්‍රතිඵලයක් වූයේ පරිසර හානිය යි. නමුත් පරිසරය, හානියට ලක්වන බැව් එවකට අවබෝධ කරගන්නට මිනිසා අසමත් විය. අදින් වසර 200කට පමණ පෙර දී පරිසරය හානියට ලක්වන බව තේරුම්ගත් හෙයින් ක්‍රමයෙන් 20 වන සියවස අගභාගය වන විට පරිසරය හා එහි සුරක්ෂිතතාව පිළිබඳ ලෝක ප්‍රජාවගේ අවධානයට ලක්විය. 2015 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලොවට හඳුන්වා දුන් 'තිරසාර සංවර්ධන අභිමතාර්ථ - 17' (United Nations, 2017) මගින් පරිසරය කෙරෙහි මිනිසා තුළ නිර්මාණය විය යුතු අවධානය පිළිබඳව මනා කතිකාවතක් ගොඩනගන්නට සමත් විය. එවැනි ජාත්‍යන්තර මෙන්ම දේශීය වශයෙන් ඉදිරිපත් වූ විද්වත් කතිකාවත් ඔස්සේ පරිසර හිතකාමී ලොවක් උදෙසා වන 'හරිත සංකල්පය' ලොව පුරා ප්‍රචලිත විය. එය එක් එක් විෂය ක්ෂේත්‍රවලට අදාළව තව දුරටත් පුළුල් සංකල්පයක් ලෙස වර්ධනය වීමත් සමඟ වර්තමානය වන විට එය සෑම ක්ෂේත්‍රයකම දක්නට ලැබෙන පාඨයක් බවට පත් වී තිබේ. ඒ අනුව හරිත නගර, හරිත ගොඩනැගිලි, හරිත ගෘහනිර්මාණ ශිල්පය, හරිත සරසවි පමණක් නොව හරිත පුස්තකාල පිළිබඳව ද සමාජයේ අසන්නට ලැබේ. හරිත පුස්තකාල ගොඩනැගිල්ලක් ස්ථාපනයේ දී සැලකිය යුතු කරුණු, වර්තමානයේ ශ්‍රී ලාංකීය පුස්තකාල මගින් ක්‍රියාවට නංවා ඇති හරිත ක්‍රියාමාර්ග, සහ හරිත පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම හා පවත්වා ගැනීම සම්බන්ධව ලෝකයේ සම්මතයන් හා ශ්‍රේණිගත කිරීම් පිළිබඳව ද මෙම විශේෂාංග ලිපිය මගින් ඉදිරිපත් කෙරේ.

ලොව පුරා විසිරී පවත්නා නොයෙකුත් පුස්තකාල වර්ගවලට අදාළව විවිධ ස්වරූපයෙන්, විවිධ ක්‍රම මගින් හරිත පුස්තකාල සංකල්පය ක්‍රියාත්මක කරනු දක්නට ලැබේ. විශේෂයෙන්ම සංවර්ධිත ඇමෙරිකාව, යුරෝපය වැනි රටවල පමණක් නොව තායිලන්තය, ඉන්දියාව වැනි රටවල ද මේ කෙරෙහි දක්වා ඇත්තේ සුවිශේෂී අවධානයකි. නමුත් ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය තුළ තවමත් මෙය ජනප්‍රිය සංවාදයක් බවට පත් වී ඇති බවක් පෙනුන ද විධිමත් ක්‍රියාමාර්ග ඔස්සේ එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරනු ලබන්නේ ඉතා සුළු වශයෙනි (Warnasooriya, 2019). ඒ අනුව පුස්තකාලයක් ස්ථාපනයේ දී භූමිය තෝරා ගැනීමේ පටන්, පුස්තකාලයේ සෑම සියලු ක්‍රියාවකදීම සිදුවන පරිසර හානි අවම කරගත හැකි මට්ටමින් පරිසර හිතකාමී බව තහවුරු කිරීම මෙන්ම පරිසරය වෙත සැලකිය යුතු මට්ටමේ අවධානයක් යොමු කරමින් තීන්දු තීරණවලට එළඹීම, 'හරිත පුස්තකාල සංකල්පය' මගින් තහවුරු කෙරෙන අතර තිරසාර වැඩසටහනකට අනුගතවීමේ වටිනාකම IFLA මගින් ද දක්වා තිබේ (IFLA, 2023). පුස්තකාල ගොඩනැගිල්ල කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළ යුත්තේ එය දිගු කාලීන, ස්ථාවර මෙන්ම වසර කීපයක උත්සහයක ප්‍රතිඵලයක් වන බැවිනි. ඒ අනුව IFLA හි ''හරිත පුස්තකාල ගොඩනැගිලි හා උපකරණ'' යන්න ඔවුන්ගේ තිරසාර න්‍යායපත්‍රය (Sustainability agenda) තුළ අන්තර්ගත කර ඇත. එමගින් දක්වා ඇත්තේ පුස්තකාල ගොඩනැගිලි හා උපකරණවලට අදාළව නිකුත් කෙරෙන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය (Carbon dioxide emission) හා කාබන් පියසටහන (Carbon footprint) හැකි පමණින් අවම කරගැනීමට උත්සුක වීමයි (IFLA, 2023).


© Newsletter of the Sri Lanka Library Association (SLLA)

'හරිත' කියූ පමණින් බොහෝ දෙනාගේ සිත තුළ මැවෙන චිත්‍රය වන්නේ ගහ කොළින් පිරුණු වටපිටාවක් සහිත පුස්තකාල ගොඩනැගිල්ලක් වුවද හරිත පුස්තකාල සංකල්පය පුළුල් මාතෘකාවකි. පරිසර හිතකාමී ලෙස හා සම්පත් කාර්යක්ෂම ආකාරයෙන් භාවිත කොට නිර්මාණය කිරීමට, ගොඩනැගීමට, අලුත්වැඩියා කිරීමට, මෙන්ම පුස්තකාල සේවා ක්‍රියාත්මක කිරීමට හා දිගුකාලීනව භාවිතයට ගත හැකි ආකාරයෙන් නිමවන වන ගොඩනැගිලි ආකෘතිය හරිත පුස්තකාල වේ.

හරිත පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම හා පවත්වා ගැනීම සම්බන්ධව ලෝකයේ සම්මතයන් හා ශ්‍රේණිගත කිරීම් නිර්මාණය වී තිබේ. ඒ අතර ශක්ති ප්‍රභව හා පාරිසරික සැලසුම්කරණ ප්‍රධානත්වය (Leadership in Energy and Environmental Design – LEED) ඇගයුම් ක්‍රමවේදය යොදාගන්නා ඇමරිකානු හරිත ගොඩනැගිලි කවුන්සිලය (United States Green Building Council - USGBC), හරිත තරු ක්‍රමවේදය (Green Star System) භාවිතයට ගන්නා ඕස්ට්‍රේලියානු හරිත ගොඩනැගිලි කවුන්සිලය (Australian Green Building Council – AGBC) සහ ඉන්දියානු හරිත ගොඩනැගිලි කවුන්සිලය (Indian Green Building Council – IGBC) (Meher & Paraboi, 2017) ආදිය පුස්තකාල ගොඩනැගිලි කෙරෙහි උනන්දුවක් දැක්වුව ද ශ්‍රී ලාංකීය පුස්තකාල ගොඩනැගිලි සම්බන්ධව එබඳු සම්මතයන් හා ශ්‍රේණිගත කිරීම් නොපැවතීම අඩුවක් සේ පෙනේ.

**ශ්‍රී ලංකාවේ හරිත පුස්තකාල ගොඩනැගිලි**

සමස්ත හරිත සංකල්පයෙහි පැතිකඩ ආවරණය වන පරිදි 2018 දී සිදුකරන ලද පර්යේෂණයක ප්‍රතිඵල අනුව අනාවරණය කරගත හැකි වූයේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල තුළ හරිත පුස්තකාල සංකල්පය ඉතා සුළු වශයෙන් ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්න ගෙන ඇති බවයි (Warnasooriya, 2019). ඇතැම් පුස්තකාල සේවකයෝ මෙවැනි සංකල්පයක් ඇති බව හෝ නොදනිති. මේ පිළිබඳ ඉහළ තනතුරු හොබවන ඇතැම් පුස්තකාල නිලධාරීන්ගේ පවා දැනුවත්භාවය එතරම් සාධනීය මට්ටමක නොපවතින බව තවත් පර්යේෂණයක් මඟින් අනාවරණය විය (Warnasooriya, 2019) . සමස්තයක් ලෙස හරිත පුස්තකාල සංකල්පය කෙරෙහි සියලුම දෙනා ධනාත්මක ප්‍රතිචාර හා අදහස් දැරුව ද සැබවින්ම ඉන් ආවරණය කරන්නේ කුමක් දැයි යන්න පිළිබඳ ඔවුන්ට පැහැදිලි අවබෝධයක් නොවීය. විදේශීය පුස්තකාල නැරඹීම හා ඒවායෙහි වෘත්තීමය වශයෙන් අත්දැකීම් ලද පිරිස් තමන්ට හැකි අයුරින් සුළු වශයෙන් හෝ හරිත සංකල්පය තම පුස්තකාල තුළ ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති ප්‍රයත්නය අගය කළ යුතුය. අඹේපුස්ස සිංහ රෙජිමේන්තුවට අනුයුක්ත පුස්තකාලය මේ වන විට ආසියාවේ විශිෂ්ටතම දෙවන විශාලතම මනාව සැලසුම් කළ හරිත පුස්තකාලය වශයෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ඇති අතර එහි කියවීම් ශාලාව දිවා ආලෝකය උපරිමයෙන් ලද හැකි පරිදි නිමවා තිබේ.



(Ambepussa Sinha Regement, 2023)

ලෝක පැළ සිටුවීමේ දිනයට සමගාමීව ගම්පහ මහජන පුස්තකාලයට අනුබද්ධව ගොඩනගන ලද හරිත පුස්තකාලය හා බීජ පුස්තකාලය ද තරමක් සාර්ථක මට්ටමේ පවතී. එසේම හරිත විශ්වවිද්‍යාල තේමාව යටතේ බිහි වූ හෝමාගම පිහිටි හරිත සරසවි පුස්තකාලය ද ස්වාභාවික වාතාශ්‍රය හා ආලෝකය උපරිමයෙන් ලද හැකි පරිදි නිර්මාණය කර ඇත.



© Newsletter of the Sri Lanka Library Association (SLLA)

හරිත සංකල්පය අනුගමනය කරමින් නව පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ දී හෝ පවතින පුස්තකාල ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණයේ දී හෝ පවතින පුස්තකාල ගොඩනැගිල්ලට අවශේෂ ගොඩනැගිලි අංග එක් කිරීමේ දී මතු දැක්වෙන කරුණු කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කිරීම වැදගත්ය.

- පරිසර හානි අවම වන ලෙස භූමිය තේරීම - ගොඩනැගිල්ල පිහිටීමට නියමිත ස්ථානයේ වන කප්පාදුව, කඳු හෝ බෑවුම් කැපීම අවම වන පරිදි සිදු කිරීම, හැකිතාක් අවට ඇති ජල පෝෂක රැකීම (ඇළ මාර්ග, ළිං ආදිය), විධිමත් කාණු පද්ධති ඉදිකිරීම සිදු කළ යුතුය.
- ගොඩනැගිල්ලෙහි අභ්‍යන්තර ගුණාත්මකබව රැකගැනීම - ස්වාභාවික වාතාශ්‍රය, ස්වාභාවික ආලෝකය උපරිමයෙන් ලැබෙන පරිදි ගොඩනැගිලි සැලසුම නිර්මාණය කිරීම. එවිට විදුලි බල්බ, විදුලි පංකා, වායු සමීකරණ සඳහා වන පිරිවැය අවම කරගත හැකිය.
- ශක්ති ප්‍රභවයන් කාර්යක්ෂමව භාවිතය - මෙහිදී ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී ජල-විදුලිය ඉතා අරපිරිමැස්මෙන් භාවිත කිරීම හා ජල කරාම ආදිය සවි කිරීමේ දී රෙගියුලේටරය සහිත කරාම සවි කිරීමෙන් පුස්තකාල සේවා සැපයීමේ දී ද පාඨකයන් හා සේවක මණ්ඩලය විසින් ජල පරිභෝජනයේ දී සිදුවිය හැකි නාස්ති අවම කරගත හැකිය. එසේම භාවිත කළ ජලය පිරිපහදු කර ඒවා සනීපාරක්ෂක කටයුතු හෝ වගා කටයුතුවලදී ප්‍රතිභාවිතයට ගත හැකිය.
- කාර්යක්ෂම ලෙස ගොඩනැගිල්ලෙහි අමුද්‍රව්‍ය භාවිතය - සිමෙන්ති, යකඩ, වීදුරු හා ලී භාවිතයේ දී අවශ්‍ය ස්ථාන සඳහා පමණක් බිත්ති යොදා ගනිමින් හැකිතාක් විවෘත ප්‍රදේශ ඉදිකිරීමෙන් අභ්‍යන්තර සිසිලස හා ස්වාභාවික ආලෝකය පවත්වා ගත හැකිය.
- ගොඩනැගිලි අලංකරණය - ගොඩනැගිල්ල අවට හෝ අභ්‍යන්තරයේ වගා කටයුතු සිදුකිරීම මගින් ස්වාභාවික සිසිලස ලබමින් උෂ්ණත්වය අවම මට්ටමක පවත්වා ගත හැකිය, හරිත බව විදහා පෙන්වන පරිසරහිතකාමී - දේශීය අමුද්‍රව්‍යවලින් නිම වූ බිම් සැකසුම් හා තිර රෙදි භාවිතයට ද යොමු විය හැකිය.
- නවෝත්පාදන - වහළයේ වගා කටයුතු සිදුකරමින් හරිත වහළයක් නිර්මාණය කිරීමට හැකිය.

පුස්තකාල ගොඩනැගිල්ල ස්ථාපනය සඳහා භූමිය තේරීමේ දී සිදුකෙරෙන වන කප්පාදු අවම වන පරිදි, පවතින ජල පෝෂක ප්‍රදේශවලට සිදුවන හානි අවම කරමින් කටයුතු කළ යුතුය. නමුත් බොහෝ පුස්තකාල නගර සීමාව තුළ පිහිටුවීමේ දී අතීතයේ පැවති වගා බිම් බොහොමයක් හානියට පත්වී තිබේ. පුස්තකාල අභ්‍යන්තර ගුණාත්මකබව රැකගැනීමේදී බොහෝ පුස්තකාල ඉන් අසමත් වී ඇත්තේ දැනට පවතින පුස්තකාල ගොඩනැගිල්ල හරිත සංකල්පයට අනුකූලව නිර්මාණය නොවීම හේතුවෙනි. ස්වාභාවිකව ලබාගත හැකි සූර්යාලෝකය මෙතරම් තිබුණ ද පුස්තකාලවල වැඩකරන පැය අට පුරාම දැල්වෙන විදුලි බල්බ ප්‍රමාණය මෙන්ම වායුසමීකරණ භාවිතය ද ඉතා ඉහළ අගයක් ගනී. වසරේ වැඩි දින ගණනක් හොඳින් සූර්යාලෝකය ලැබෙන සර්ම කලාපීය රටක් වන නමුත් සූර්යකෝෂ පැනල භාවිතයට ගන්නා පුස්තකාල ඉතා සුළු වශයෙන් තිබීමෙන් ගම්‍ය වන්නේ ස්වාභාවික ශක්ති ප්‍රභවයන් කාර්යක්ෂමව භාවිත කිරීමට අපොහොසත් වී ඇති සෙයකි.

එසේම ගොඩනැගිලි සඳහා යොදාගන්නා ඉදිකිරීම් අමුද්‍රව්‍ය වශයෙන් බහුලවම යොදාගෙන ඇත්තේ සිමෙන්ති, ගල්, වැලි, වීදුරු, යකඩ, දැව, ඇලුමිනියම් ආදියයි. වැඩි වශයෙන් පුස්තකාල තුළ වීදුරු, යකඩ, හා ඇලුමිනියම් මගින් කුඩා කාමර වෙන් කර තිබීමෙන් අභ්‍යන්තර උෂ්ණත්වය ඉහළ නංවන අතර ඒ එක් එක් කාමර සඳහා වෙන් වෙන් වශයෙන් විදුලි පංකා හෝ වායු සමීකරණ යොදා ගැනීමේ අවශ්‍යතාව පැන නැගී ඇති බැවින් පුස්තකාල ගොඩනැගිලි ආකෘතිය නිර්මාණයේදී ගෘහනිර්මාණ ශිල්පියා සතු වගකීම ඉස්මතු වන්නේ මෙහිදී ය. හැකිතරම් විවෘත ප්‍රදේශවලින් *(open areas)* සැදුම්ලත් පුස්තකාල ගොඩනැගිල්ලක් නිර්මාණය කිරීමෙන් අභ්‍යන්තර උෂ්ණත්වය පාලනයත්, වැය වන අමුද්‍රව්‍ය ප්‍රමාණය අවම කරගැනීමටත්, වඩාත් පහසුවෙන් පුස්තකාල අධීක්ෂණ කටයුතු නිසි පරිදි ඉටුකිරීමටත් අවස්ථාව උදාකරගත හැකිය.



© Newsletter of the Sri Lanka Library Association (SLLA)

පරිසර හිතකාමී මෙන්ම අවම පිරිවැයකින් යුක්ත ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයට ගැනීම නව ප්‍රවණතාවකි. මොරටුව විශ්වවිද්‍යාලයේ ගෘහනිර්මාණ ශිල්පීය විෂයට සමගාමීව ආචාර්යවරයෙකු විසින් හඳුන්වා දෙන ලද මඩ සිමෙන්ති *(mud cement)* ඊට කදිම උදාහරණයකි. එය පුරාණ කාලයේ දාගැබ් ආදිය ඉදිකිරීමට යොදාගත් ශක්තිමත් අමුද්‍රව්‍යයක් ලෙස සැලකේ. එසේම CINEC පෞද්ගලික විශ්වවිද්‍යාලයේ එක් ගොඩනැගිල්ලක බිත්ති ස්වාභාවික පිදුරු ඇඹරීමෙන් ගොඩනගා ඇති අතර එය දැනට වසර 10කට ආසන්න කාලයක් පුරාවට පවතින්නකි. මෙබඳු නව නිර්මාණයන් අපගේ සුවිශේෂී අවධානයට ලක්වන්නේ නම් පිරිවැය අවම කරලීමට සේම ඉවතලන අමුද්‍රව්‍ය සඳහා ආර්ථිකමය වටිනාකමක් ද එක් කළ හැකිය.

බාහිර අලංකරණ කටයුතු සඳහා වැඩි නැඹුරුවක් පුස්තකාල මඟින් පෙන්නුම් කළ ද එය ඇතැම් විට ස්වාභාවික මල් බඳුන් කිහිපයකට පමණක් සීමා වනු දැකිය හැකිය. නමුත් සැබවින්ම පාඨක ආකර්ශනය සෘජුවම ලබාගත හැකි ක්‍රමයක් ලෙස අලංකාර පැළ වර්ග ස්ථිනගත කිරීම හඳුන්වා දීමට හැකිය. නමුත් විදේශීය රටවල තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස් ආරක් ගනුලබන්නේ බොහෝ ශීතාධික රටවල එවැනි ස්වාභාවික වගාවන් නිසා ඇතිවන කෘමි උවදුරුවල බලපෑම එතරම් ප්‍රබල නොවන බැවිනි. එමනිසා එවැනි රටවල පුස්තකාල වහළය පෙට්ටි ආකාරයට *(box type)* සකස් කරන අතර එහි වහළයේ වගා කටයුතු සිදුකරනු ඇත. එය හරිත වහළය *(green roof)* යනුවෙන් හඳුන්වනු ලැබේ. කොළ පැහැති තිර රෙදි, පැදුරු, මේස පුටු, බිත්ති ආලේපන, බිම් සැරසිලි පුස්තකාලයට එක් කර ගත හැකි අතර ඉන් සිදුවන්නේ හරිත පණිවිඩය පාඨකයා අතරට යාමයි.

දැනට ගොඩනගා ඇති පුස්තකාල ගොඩනැගිල්ල සඳහා හරිත සංකල්පය ක්‍රියාත්මක කිරීම තරමක් අපහසු වුවද හරිත සංකල්පයෙහි එන විවිධ හරිත ක්‍රියාපටිපාටි හා පිළිවෙත් අනුගමනය කිරීම වඩාත් යෝග්‍ය වේ. ඊට හේතුව හරිත සංකල්පය යන්න පුස්තකාල ගොඩනැගිල්ල මගින් සාක්ෂාත් කරගැනීමට නම් භූමිය තේරීමේ අවධියේ සිටම ඒ වෙනුවෙන් සැලසුම් සකස් කළ යුතු බැවිනි. නමුත් පවතින ගොඩනැගිල්ලට බද්ධ කොට නව ඉදිකිරීමක් සිදුකරන්නේ නම් ඉහත දැක්වූ හරිත කරුණු වෙත නැඹුරුවක් දැක්වීම වඩාත් යෝග්‍යය.

ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත හරිත ගොඩනැගිලි කවුන්සිලය මගින් වෙනත් ගොඩනැගිලි ශ්‍රේණිගත කර තිබුණ ද ප්‍රමිතිගත මට්ටමින් හරිත පුස්තකාල ඉදිකිරීම ප්‍රවර්ධනය කිරීම උදෙසා ඉහළ ප්‍රවණතාවක් දක්නට නොලැබේ. එනමුත් ඇතැම් පුස්තකාල දැනුවත්ව හෝ නොදැනුවත්ව හරිත ලක්ෂණ සුළු වශයෙන් හෝ තම පුස්තකාල තුළට ඇඳා ගැනීමට ගන්නා ප්‍රයත්න අගය කළ යුතුමය. නමුත් සැබවින්ම හරිත පුස්තකාල සංකල්පය යනු කුමක් දැයි නිවැරදිව අධ්‍යයනයට ලක් කිරීමෙන් අනතුරුව එය ක්‍රියාත්මක කිරීමට උත්සුක වීම වඩාත් යෝග්‍යතම ක්‍රමවේදය බව පැහැදිලිවම සඳහන් කළ යුතුය.

**විමර්ශන**


Ambepussa Sinha Regement. (2023, October 12). *A talk with award-winning architect, Dr Milinda Pathiraja.* Retrieved from New straits times: https://www.nst.com.my/news/2016/12/197607/talk-award-winning-architect-dr-milinda-pathiraja

IFLA. (2023, October 12). *What is a Green Library?* Retrieved from IFLA: https://www.ifla.org/g/environment-sustainability-and-libraries/ifla-green-library-definition/

Meher, P., & Paraboi, L. (2017). Green library: an over view, issues with special reference to Indian Libraries. *International Journal of Digital Library Services, 2*(7), 62 - 69.

Warnasooriya, W. (2019). A study on green moments in selected libraries in Western Province, Sri Lanka. *Proceeding of National Conference on Library and Information Science* (pp. 17 - 35). Colombo: Sri Lanka Library Association.

Warnasooriya, W. (2019). A study on the awareness of green library concept:. *Proceeding of ICLIM 2019.* Kelaniya: Department of Library and Information Science.




© Newsletter of the Sri Lanka Library Association (SLLA)